# ආරක්ෂක අමාත්‍යාංශය

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI)

# ඇබෑර්තු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ AR-2 [ඉංජිනේරු (සිවිල් - තනතුරු 1) / ද්‍රව්‍ය (තනතුරු 1)/ භූ විද්‍යාඥ - (තනතුරු 1)/ පාරිසරික විශේෂඥ - (තනතුරු 01)/ ප්‍රමාණ සමීක්ෂක - (තනතුරු 1)]

**බාහිර**

**සුදුසුකම් : (පහත අ හෝ ආ)**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනයෙන් යුක්ත ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණවේදය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ සිවු අවුරුදු (04) ප්‍රථම උපාධිය

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම (මාස්ටර්) හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ සංස්ථාවක, මණ්ඩලයක. ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්ද.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනයෙන් යුක්ත ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණවේදය හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක්.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (Phd - දර්ශන ශූරී) උපාධියක්

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

සැ. යු. අදාළ විෂය ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රකාශන පළකර තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

### විද්‍යාඥ AR-1, Gr.ii [ඉංජිනේරු (සිවිල් - තනතුරු 5)/ ද්‍රව්‍ය - (තනතුරු 4) / භූ විද්‍යාඥ - (තනතුරු 19) / නගර නිර්මාණ ශිල්පී - (තනතුරු 3) / ප්‍රමාණ සමීක්ෂක - (තනතුරු 2)]

**බාහිර**

**සුදුසුකම් : පහත අ හෝ ආ හෝ ඇ**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනයෙන් යුක්ත ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණ වේදය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ සිවු අවුරුදු (04) ප්‍රථම උපාධිය.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උචිත විෂය සංකලනයෙන් යුක්ත විද්‍යාව පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ තුන් අවුරුදු (03) ප්‍රථම උපාධිය.

**සහ**

ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණ වේදය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් / ඩිප්ලෝමාවක්

**හෝ**

(ඇ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ (SLIA) උපාධි සාමාජිකත්වය.

සැ. යු. තනතුරට අදාළ පර්යේෂණ පළපුරුද්ද අමතර වාසියකි.

### කළමනාකරණ සහකාර (තාක්ෂණ) MA 2-2, Gr.iii [සිවිල්, ප්‍රමාණ සමීක්ෂක, සැලසුම් ශිල්පී, රසායනාගාර] (තනතුරු 10)

**සුදුසුකම් :**

**බාහිර :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම හෝ රජයේ කාර්මික විද්‍යාලයකින් ජාතික තාක්ෂණ සහතිකය (NCT) ලබාතිබීම හෝ සමාන සුදුසුකමක්.

**හෝ**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් රසායනාගාර ඩිප්ලෝමාවක් ලබාතිබීම.

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද අමතර වාසියකි.

**පොදු කොන්දේසි**

- වැටුප් පරිමාණය : AR-2 (රු. 133,220/- 10X3,600) -169,220/=
  මූලික වැටුප් පියවර : රු. 116,763/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි ii උපලේඛනය ප්‍රකාරව)
- වැටුප් පරිමාණය : AR-1 Gr.ii [(රු. 91,650/- 10X2,480 - 15X3,450- 168,200/=)]
  මූලික වැටුප් පියවර : රු. 81,675/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි ii උපලේඛනය ප්‍රකාරව)
- වැටුප් පරිමාණය : MA 2-2, Gr iii
  [රු. 50,540 - 10X540 - 7X630-4X1,080 - 20X1,280-90,270/=]
- මූලික වැටුප් පියවර : රු. 46,960/= (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි ii උපලේඛනය ප්‍රකාරව)

**වයස් සීමාව :**

AR -2 : වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

AR-1 : Gr. ii - වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

MA 2-2 : Gr iii - වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අභ්‍යන්තර සුදුසුකම් අනුව අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.**

**වෙනත් ප්‍රතිලාභ**

- ජීවන වියදම් දීමනාව
- ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදලට 12% ක් සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% ක් වශයෙන්ද දායකත්වය දරනු ඇත.
- රාජ්‍ය චක්‍රලේඛයන්ට අනුව ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.
- මාසික කාර්යය සාධන දීමනා
- ජීවිත රක්ෂණ ආවරණ සහ වෛද්‍ය රක්ෂණ ආවරණය
- දුරකථන දීමනා
- රජය විසින් අනුමත වෙනත් දීමනා

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත් අදාළ සහතිකවල තමන් විසින්ම සහතික කරන ලද පිටපත් සමග 2026 මාර්තු 03 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**